බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

මගේ අංකය / My Number: USJP/EEX/03/2022
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481,011-3132496, 011-5929791
ෆැක්ස් / Fax: 011-2802753

ලිපිනය / Address: තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකා / Post Box 10,Gangodawila, Nugegoda, Sri Lanka,
වෙබ්අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail: info.ext@sjp.ac.lk


2022-05-26

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

**සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය**

**(2014 / 2015 / 2017) පුනර් අපේක්ෂකයන් සඳහා අයදුම්පත් කැඳවීම - 2022**

01. **පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට හා පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වමි.**

| | |
|---|---|
| පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියට පිවිස ඉහත ශීර්ෂය යටතේ ඇති වෙබ් පිටුවේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "V"අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| **පුනර් පරීක්ෂණ ගාස්තු**<br>එක් විෂයයක් සඳහා<br>විෂයයන් 2 ක් සඳහා<br>විෂයයන් 3 ක් සඳහා<br>විෂයයන් 4 ක් සඳහා<br>විෂයයන් 5 ක් හෝ වැඩි සංඛ්‍යාවක් සඳහා | <br>රු. 2,000 /=<br>රු. 4,000 /=<br>රු. 6,000 /=<br>රු. 8,000 /=<br>රු. 10,000 /= |
| අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය (පළමුව **exams.edecu@sjp.ac.lk** විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර, පසුව තැපෑලට යොමු කළ යුතුය.) | සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.** |
| අයදුම්පත් භාරගන්නා අවසාන දිනය | 2022/ 06 /30 |
| **ලියාපදිංචිය දීර්ඝ කිරීම**<br>2014 වර්ෂයේ ලියාපදිංචි සිසුන් - 2021.08.31 දිනට<br>2015 වර්ෂයේ ලියාපදිංචි සිසුන් - 2021.09.30 දිනට<br>2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන් - 2021.08.14 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය. | ලියාපදිංචිය දීර්ඝ කිරීම පිලිබඳ විස්තර www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ලබාගත හැක. |

02. සැලකිය යුතුයි

I. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ප්‍රථම, **exams.edecu@sjp.ac.lk** විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර, ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ.

II. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2022 / 06 /30 වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

III. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **(එහි ඡායාපිටපතක් ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංකවලට ගෙවන ලද මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ).**

IV. **2017 අධ්‍යයන වර්ෂයට අයත් සිසුන් ඉහත III පරීක්ෂණයට අයදුම්කිරීමට ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික ගෙවීම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

V. පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට නම් අනෙකුත් අවශ්‍යතා සමඟ ලියාපදිංචිය දීර්ඝ කිරීමට අවශ්‍ය සිසුන් තම ලියාපදිංචිය දීර්ඝ කිරීම අනිවාර්ය වේ.

VI. නියමිත පරිදි මුදල් නොගෙවන ලද, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VII. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි III විභාග කාල සටහන www.external.sjp.ac.lk යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියේ Academics/ Exams/ Exam Timetables යටතේ පලකරනු ඇති අතර විභාග ප්‍රවේශපත් (Examination Admission Cards) වෙබ් අඩවියේ පමණක් පල කරනු ලබන අතර තැපැල් මඟින් නිකුත් නොකෙරේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**292 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

7.4 අසනීප නිසා මුළු විභාගයටම හෝ විභාගයේ කොටසකට පෙනී නොසිටි/ නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාග ආරම්භ වීමට ප්‍රථම හෝ විභාග පැවැත්වෙන කාල සීමාව තුළ හෝ රජයේ ආරෝග්‍ය ශාලාවකින් වෛද්‍ය සහතිකයක් නියෝජ්‍ය ලේඛකාධිකාරී හෝ සහකාර ලේඛකාධිකාරී/ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

7.5 නොවැලැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාල විභාගය හෝ විභාගයේ කොටස පැවැත්වීමට නියමිත දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු ය. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ.

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
තැ.පෙ.අංක 10, ගංගොඩවිල, නුගේගොඩ.